c
181.043
WIC

# විශ්ව මානව හිමිකම් විෂයයෙහි දැක්වෙන බෞද්ධ සමාජ-නීති දර්ශනයේ මූලධර්ම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

***A COMPARATIVE STUDY OF THE PRINCIPLES OF SOCIAL PHILOSOPHY OF BUDDHIST LAW AS REFLECTED IN UNIVERSAL HUMAN RIGHTS***

UNIVERSITY OF PERADENIYA
28 JUN 2010
LIBRARY

පරාක්‍රම ශ්‍රී වික්‍රමරත්න

**ලියාපදිංචි අංකය - GS/M.Phil./94/683**

දර්ශන සහ මනෝවිද්‍යා අධ්‍යයන අංශය

දර්ශනපති පශ්චාද් උපාධි පරීක්ෂණයට අදාළව ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධයයි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය - පේරාදෙණිය - ශ්‍රී ලංකාව.

1995/1996

635566

## THE ABSTRACT

The topic : A Comparative study of the Principles of Social Philosophy of Buddhist Law as Reflected in Universal Human Rights.

I, Parakrama Sri Wickramaratna, am submitting this work under the Department of Philosophy as a partial requirement for the degree of Master of Philosophy.

The idea of human rights can be regarded as an important field of philosophy born and developed in eastern and western countries. One could see philosophically and socially important value systems in Buddhist jurisprudence. Based on this foundation, it contains a comparative analysis of Buddhist Sutras and the European Declaration of human rights. It also further analyses the origins of philosophical doctrines of the Buddhist thoughts, traditions, and practices and examines how far the concepts contained in the universal declaration of human rights can justified.

It also analyses, basing on the principles of Buddhist legal philosophy, the manner in which the origin of universal declarations during the last five decades in the international society, and the violations of human rights and the systems of prescribed ways and methods to counter them.

Imagining that the lack of modern English international law in creating a human rights law regarding human inter-relations and social co-existence, this thesis suggests, in light of modern international law, the Buddhist doctrines regarding those situations.

We make a comparative analysis of those Buddhist concepts of duties, rights, and social equality of the law of human rights in the context of Buddhist ethical philosophy.

We further discuss the philosophical criteria of good and bad in ethical context of human rights.

We also discussed about the normative relations between Buddhist doctrine of discipline and jurisdiction and the modern court systems.

Finally, the conclusion arrived is the that the only way of establishing human rights in society is not only the promulgation of legislative procedures but it can be done only by making a thinking revolution within human beings.

## (1) නිබන්ධ සාරාංශය :

### i. පර්යේෂණ අරමුණ : *(Research Purpose )*

මානව හිමිකම් සෑම සමාජ ක්‍රමයක සදාචාර විරෝධී හැසිරීම් හෙළාදකින, මිනිසා උපතින්ම උරුම කර ගත් ජාත්‍යන්තර නීතියේ විශේෂ කොටසක් වෙයි. මානව හිමිකම් පිළිබඳ මෑත කාලීන වශයෙන් මතුවී පෙනෙන උද්ඝෝෂණය සහ ප්‍රචණ්ඩතාවය දාර්ශනික සහ සමාජයීය ගැටළුවක් වශයෙන්, සමාජය වෙතින් උද්ගත වී තිබෙන්නක් බවට කල්පිතයක් ගොඩ නැගිය හැකි ය. මිනිසාගේ අභිවෘද්ධිය සඳහා මිනිසා විසින් අනුගමනය කළ යුතු සාරධර්ම පද්ධතිය පිළිබඳ ගවේෂණය කිරීමේ දී මිනිස් අයිතිවාසිකම් ගැන බුදුසමය දක්වන නිර්දේශයන් වෙසෙසින් ප්‍රකට වේ.

මානව හිමිකම් පිළිබඳ බෞද්ධ සංකල්පය මූලික තාර්කික භව්‍යතාවයන් දෙකක් මත ගොඩ නැගෙයි. පළමු තාර්කික භව්‍යතාවය වූ දාර්ශනික අංශයෙන් ප්‍රකාශ වන්නේ සියලු සත්වයින්ට නිදහස ස්වභාවයෙන්ම උරුමව පවතින බවත්, එය අනියතවාදී හේතුඵල නියාම ධර්මතාවයට යටත් වන බවත් ය. දෙවැන්න ආචාර විද්‍යාත්මක දෘෂ්ටියෙන් ඉදිරිපත් වෙයි. එනම් "සියලු සත්ත්වයෝ සැපතට කැමති වෙති" යන බුද්ධිමය පිළිගැනීම ය. මේ අනුව නිගමනය වන්නේ මානව හිමිකම් පිළිබඳ බෞද්ධ නීති විග්‍රහය, නූතන නෛතික ස්වරූපයට වඩා මානුෂීය අංශයෙන් උසස් බව ය.

මානව හිමිකම් පෙර-අපර දෙදිග රටවල ඓතිහාසිකව වර්ධනය වෙමින් පැවතුනකි. ආදිබුදුසමයෙහි අන්තර්ගත කරුණු ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී විද්‍යාමාන වන්නේ මානව හිමිකම් පිළිබඳ දාර්ශනික සහ සමාජයීය වශයෙන් වැදගත් සාරධර්ම පද්ධතියක්, වෙනත් කිසිම මූලාශ්‍රයකින් නොලැබෙන බව ය. ප්‍රාග්-බෞද්ධ ඉන්දිය චින්තනය තුළද, නූතන මානව හිමිකම් විග්‍රහ කිරීමට ගුරුකොට ගත හැකි ප්‍රමාණවත් මූලාශ්‍ර පැවතුණි.

යුරෝපා රාජ්‍යයන් හි පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කර පවත්වා ගෙන යාමට විවිධ ප්‍රකාශන (ව්‍යවස්ථාපිත) ඉදිරිපත් විය. 1948 වර්ෂයේදී එක්සත් ජාතීන් විසින් "විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය" *"Universal Declaration of Human Rights"* ප්‍රකාශයට පත් කළේය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සංකල්පයන් බුදු සමයේ සූත්‍ර දේශනාවන් හි අන්තර්ගත කරුණු සමඟ තුලනාත්මකව විග්‍රහ කිරීමක් මෙම පර්යේෂණයේ දී අප අරමුණ වෙයි. බෞද්ධ ත්‍රිපිටකාශ්‍රිත සූත්‍ර දේශනාවන් හා වෙනත් ඓතිහාසික සාහිත්‍ය ග්‍රන්ථ මෙහිලා වැදගත් මූලාශ්‍රයෝ ය.

මානව අයිතිවාසිකම් පිළිබඳව ඉදිරිපත් වන නවීන සංකල්ප ආදීබුදුසමයේ පැනෙන අතිශය දාර්ශනික, සාධාරණ, යුක්තිසහගත සහ කාරුණික වූ ද සංකල්පයන්ගේ හුදු ඡායාවක් පමණි. විශ්ව මානව හිමිකම් පිළිබඳ බෞද්ධ නීති දර්ශනයේ එන සංකල්ප සුවිශේෂ වූ දාර්ශනික සන්දර්භයක් තුළ පොඩ නැගී, සමාජයීය වශයෙන් ක්‍රියාත්මක විය. විද්‍යාව සහ තාක්ෂණය නූතන ස්වරූපයෙන් ගුරුකොට ගන්නා නූතන සමාජ රටාවකට ඒවා කොතෙක් දුරට ප්‍රතිෂ්ඨාපනය කළ හැකි ද යන්න පර්යේෂණය කළ යුතු ය. නූතන ව්‍යවහාරයන් සමඟ විසංවාදී වන්නේ, විශ්වය සහ මිනිසා පිළිබඳ මෙලොව සහ පරලොව වශයෙන්, බුදු දහමෙන් ප්‍රභාවිත ඉගෙන්වීම පදනම කර ගෙන ය. පසුකාලීනව, පරිපූර්ණත්වයට පත්වීමේ මානුෂික සත්‍යතාව මත මානව අයිතිවාසිකම් නෛතික පදනමකින් නූතන රාජ්‍යයන් තුළ ස්ථාපිත විය. එයින් සිදු වූ හානිදායක ප්‍රතිඵලය වූයේ ආරම්භයේ දී ඉතා පුළුල් දාර්ශනික පදනමකින් ප්‍රභවය වූ මානව හිමිකම, හුදු පෞද්ගලික අයිතිවාසිකම් සමූහයක තත්ත්වයට පත්ව පිරිහී යාම ය.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු වන්නේ නූතන මානව හිමිකම් ප්‍රකාශන කොතෙක් දරිද්‍රතාවයෙන් යුක්ත වන්නේද යන්න හෙළිදරව් වන්නේ විශ්වමය වූ දාර්ශනික දෘෂ්ටියකින් ඒ පිළිබඳ විග්‍රහ කිරීමේ දී ය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයන්ගේ විශ්වමය අදහස පිළඹිමු වන්නේ මුළු විශ්වයම එය උපයෝගී කිරීමට ඇති කැමැත්ත මත මිස, එහි ඇති විශ්වමය දාර්ශනික ස්වරූපය නිසා නොවේ.

බෞද්ධ චින්තනයෙන්, සම්ප්‍රදායන්ගෙන්, වතාවත්වලින් ප්‍රභාවිත දාර්ශනික සංකල්ප හා පරිචයයන් සමඟ විශ්ව ප්‍රකාශනයේ එන සංකල්පයන් කොතෙක් දුරට යුක්ති සහගත වන්නේ ද යන්න ගවේෂණය කළ යුතු ය. **බෞද්ධ සමාජ නීති දර්ශනයේ ඉගෙන්වෙන සදාචාර සංකල්ප ගණනාවක් ඇත. ඒවා උද්ධරණය කර ජාත්‍යන්තර නීතිය සඳහා ආවශ්‍යක විශ්ව මානව හිමිකම විෂයයෙහි දැක්වෙන බෞද්ධ සමාජ නීති දර්ශනයක් නිර්මාණය කිරීම අප පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ.**

### *ii.* පර්යේෂණ ගැටළුව: *(Research Problem)*

බටහිර යුරෝපා රාජ්‍යයන් හි දහසය වන සියවස මුල් භාගයේ දී ආගමික රාජ්‍ය සංකල්පයට එරෙහිව ජාතික රාජ්‍ය සංකල්පය (ස්වාධීන රාජ්‍යය) බිහි විය. අභිනවයෙන් බිහි වූ ජාතික රාජ්‍යයන් තුළ "දේශපාලන බලය" යුක්ති සහගත කිරීම කෙරෙහි බලපෑ නීති-රීති සහ සම්ප්‍රදායයන් හඳුනා ගැනීමට නූතන ජාත්‍යන්තර නීතිය *(International Law)* ප්‍රභවය විය. ඒ සමඟම බටහිර කාර්මික විප්ලවයන් ද ඇති විය. **එවැනි සමාජ තත්ත්වයක්**

හමුවේ දක්නට වූ සුවිශේෂ සමාජ සංසිද්ධියක් වූයේ ආගම-ධර්මයට නැඹුරුව මිනිසුන් ගෙන ගිය සිතුම්-පැතුම් රටාව වෙනස් වී යාමයි. මිනිසා සැම දෙයක් ගැනම භෞතික අංශයෙන් සිතීමට පුරුදු-පුහුණු විය. මුදල් සහ ලිංගික චර්යාව මිනිසාගේ ජීවන දර්ශනය බවට පත් විය. මෙයින් සිදු වූ හානිදායක ප්‍රතිඵලය වූයේ සමාජගත සාරධර්ම හා අධ්‍යාත්මික ගුණවගාව පුද්ගලයා වෙතින් බෙහෙවින් ඉවත්ව යාම ය. මෙහිදී සමාජයීය යුතුකම් අමතක කර දැමී ය. මෙවැනි පසුබිමක් යටතේ මානව හිමිකම *(Human Rights)* පිළිබඳ ගැටළුව මතු වූ බව නිගමනය කළ හැකි ය.

සමාජ විකාශනයේ මුල් අවධියේ දී භාරතය වැනි පෙරදිග රාජ්‍යයන්හි මානව අයිතින් පමණක් නොව, අවංශ සත්ව සමූහයාගේ ම අයිතීන් පිළිගැනුණු තත්ත්වයක් පැවති බවට සාක්ෂ්‍ය ඇත. බෞද්ධ නීති දර්ශනයට අනුව අයිතිවාසිකම පිළිබඳ ප්‍රශ්නයක් පැන නොනගියි. සමාජයීය යුතුකම ඉටු වූ තැන කිසිවකුට අයිතියක් ඉල්ලා සිටිය යුතු නොවෙ යි. එකකු-දෙන්නකු තම යුතුකම් ඉටු කළ පමණින් එය ඉටු නොවෙයි. එනම් මානව හිමිකම් තහවුරු වීමට නම්, එය පුද්ගල උත්සාහයක් ලෙස නොව, සමාජයීය වශයෙන් සියලු දෙනා විසින් ම තම යුතුකම් කොටස ඉටු කළ යුතු ය.

ඉතා දුරාතීතයේ සිටම බටහිර යුරෝපා රාජ්‍යයන්හි ද මානව නිදහස පිළිබඳ බෙහෙවින් සාකච්ඡා කරන ලදී. නිදසුන් ලෙස පැරණි ග්‍රීසියේ ප්ලේටෝ *(Plato)* සහ ඇරිස්ටෝටල් *(Aristotle)* වැනි චින්තකයින් ජීවත් වූ යුගයේ දී ද සිතීමේ සහ කතා කිරීමේ නිදහස *(Freedom of Thought and Speech)*, නීතිය ඉදිරියේ සමානාත්මතාව *(The doctrine of Equal before the Law)* සහ නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව *(The doctrine of Equal Protection of the Law)* යනාදී අයිතීන් පිළිගෙන තිබුණි. 17 වන සියවසේ දී පමණ මානව හිමිකම පිළිබඳ සංකල්පය ජාත්‍යන්තර නීතියේ ස්ථාපිත වෙමින් නිෂේධ කළ නොහැකි මූලික අයිතියක් *(Fundemental Rights)* ලෙස පිළි ගැනීමට යෙදුණි.

නූතන ව්‍යවහාරයේ පවතින ක්‍රිස්තියානි ලබ්ධික ආභාසය ලත් ජාත්‍යන්තර නීතිය මානව හිමිකම් පිළිබඳ විශ්ව සාධාරණ මිණුම් දණ්ඩක් නොවන බව සඳහන් කළ යුතු ය. එසේම මානව හිමිකම් පිළිබඳ මතවාදය බටහිර යුරෝපා රාජ්‍යයන්ගෙන් ප්‍රභවය වූවක් ද නොවේ. නමුත් සමකාලීනව දක්නට ඇති ප්‍රවණතාවය වන්නේ එය බටහිර ශිෂ්ටාචාරය සහ ආභාසය වෙතින් උද්ගත වූවක් ලෙස ය. පෙරදිග වැසියා වඩාත් පිළිගත්තේ අයිතිවාසිකම් *( Righrs)* පිළිබඳ මතය නොව, යුතුකම *(Duties)* පිළිබඳ මතය යි.

මෑත කාලීන වශයෙන් මානව හිමිකම් පිළිබඳ ගැටළුව සබඳව විමතියක් නොවූවත්, විශ්ව මානව හිමිකම් ආරක්ෂා කර තහවුරු කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් දක්නට නැත. ජාත්‍යන්තර නීතියේ මූලධර්ම නැවත නැවතත් විමර්ශනයට ලක්කර, මානව හිමිකම් ඇතුළත් විශ්ව සාධාරණ ජාත්‍යන්තර නීතියක් නිර්මාණය කිරීමට දැන් කාලය එළැඹ ඇත. බෞද්ධ චින්තනය මූලාශ්‍ර කර ගත් ජාත්‍යන්තර සමාජ නීති දර්ශනයක් ව්‍යක්ත ලෙස විශ්ව නීතියට හඳුන්වා දීමේ අවශ්‍යතාවය ද මතුව ඇත. මේ සඳහා වැදගත් කාර්යයන් කිහිපයක් පුද්ගලයා වෙත ජනිත කළ යුතු වේ. එනම්,

(අ) නීති-රීති පැනවීම මගින් නොව, සමාජය පිළිබඳව මානව සිතුම්-පැතුම් අතින් විප්ලවයක්,

(ආ) සමාජ සාරධර්ම හා අගයයන් පිළිබඳ නැවත සලකා බැලීමක්,

(ඇ) ආගමික සහ අධ්‍යාත්මික චින්තන රටාවක් ඇති කර ලීම.

කෙරෙහි උත්සුක විය යුතු ය.

එසේම මානව වර්ගයාගේ පොදු සමාජ සහපත ඇති කිරීම, මානව වර්ගයා වෙතම පැවරී ඇති වගකීමක් බව අවබෝධ කර ගත යුතු ය.

## iii. පර්යේෂණ ක්‍රමවේදය :(Research Methodology)

මානව හිමිකම් පිළිබඳ අධ්‍යයනය ජාත්‍යන්තර නීතියේ කේන්ද්‍රිය අංශයකි. ආසියාකරයෙහි පමණක් නොව, මුළු මහත් පෘථිවි තලයේ ම එක් ජාතියක් තුළ මෙන්ම ජාතීන් අතර ද විවිධ ආකාරයේ මානව හිමිකම් නිෂේධ කර ඇති ආකාරයක් දෘශ්‍යමාන වෙයි. මෙය මෑත කාලීන වශයෙන් මෙන් ම අනාගතයට ද මානව සංහතියට බරපතල තර්ජනයක් වනු නිසැක ය. මනුෂ්‍යයා අතර අන්‍යෝන්‍ය සහයෝගය සහ සමාජ සහජීවනය පදනම් කර ගත් විශ්ව සාධාරණ මානව හිමිකම් නීතියක් ගොඩ නැගීමට නූතන ඉංග්‍රීසි ජාත්‍යන්තර නීතිය ප්‍රමාණවත් නොවන බව සඳහන් කළ යුතු ය. නූතන ජාත්‍යන්තර නීතිය ප්‍රභවය වී වර්ධනය වූයේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය සහ එම ආචාරධර්ම පදනම් කර ගෙන, බටහිර යුරෝපීය ශිලාචාර යැයි පවසන රාජ්‍යයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් තම ක්‍රියාවන් පවත්වා ගෙන යාමට අවශ්‍ය නීති-රීති සහ සම්ප්‍රදායන් සමුදායක් ස්ථාපිත කරනු සඳහා ය. නමුත් ක්‍රි.පූ.හයවන සියවසේ සිට ආසියාකරයේ ශීලාචාර රාජ්‍යයන් සමූහයක් පැවති අතර, එම රාජ්‍යයන් අතර රාජතාන්ත්‍රික සබඳතා පැවැත්වීමේ දී පිළිගත් නීති-රීති සහ සම්ප්‍රදායයන් සමූහයක් ද විය. ඒවා බුදු සමයේ ව්‍යාප්තියත් සමඟ බෞද්ධ නීති මූලධර්ම

**විය. ඒවා බුදු සමයේ ව්‍යාප්තියත් සමඟ බෞද්ධ නීති මූලධර්ම අනුව සැකසුනු අයුරු පෙරදිග චින්තන ඉතිහාසය පිළිබඳ විචාර පූර්වක විමර්ශනයක දී නිගමනය වෙයි.**

ඒ අනුව බෞද්ධ සමාජ නීති දර්ශනයේ දැක්වෙන මූලධර්ම පදනම් කර ගෙන විශ්ව සාධාරණ වූ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියක් ගොඩනැගිය යුතු බව අවධාරණයෙන් සඳහන් කළ යුතු ය. ඒ සඳහා උපස්තම්භක වන මූලාශ්‍ර ගණනාවක් ගවේෂණයට ලක් කළ යුතු ය. භාරතීය නීති දර්ශනයේ ආදි බුදුසමය (චින්තනය) ඉතා උසස් තත්ත්වයක පවතී. ප්‍රාග් - බෞද්ධ ඉන්දීය වෛදික සංස්කෘතියේ වර්ධනය තුළ ද අගනා නීති දර්ශනයක් විය. ආදි බුදුසමය නිරූපණය කරන පාලි ත්‍රිපිටකය සදාචාර නීති දර්ශනයක ධර්ම මංජුසාව ලෙස නම් කළ හැකි ය. ගිහි-පැවිදි විනය මුල් කර ලියවුණු ත්‍රිපිටකාශ්‍රිත විනය නීති-රීති, විශ්ව මානව හිමිකම් නීතියක් සඳහා මූලාශ්‍ර කර ගත යුතු ය. එසේම නූතන රාජ්‍යයන් තුළ ස්වදේශීය නීති සම්පාදනයේ දී කොතෙක් දුරට බෞද්ධ නීති මූලධර්ම ගුරු කොට ගන්නේ ද යන්න විමර්ශනය කළ යුතු ය. ජාතික රාජ්‍යයන් මෙන්ම ජාත්‍යන්තර යුක්ති අධිකරණය විසින් විනිශ්චිත නඩු තීරණයන් ද පර්යේෂණයට හසු කර ගත යුතු ය. ජාත්‍යන්තර යුක්ති අධිකරණය ලෝක දේශපාලන සහ සමාජයීය සිද්ධිමය කරුණු විෂයයෙහි දෙනු ලබන විනිශ්චයයන් කොතෙක් දුරට, විශ්ව සාධාරණ වන්නේ ද සහ බෞද්ධ නීති මූලධර්ම සමඟ උචිත වන්නේ ද යනුවෙන් විමර්ශනය කළ යුතු ය. අවසාන වශයෙන් සඳහන් කළ යුතු වන්නේ මෙම අධ්‍යයනය සඳහා වූ පර්යේෂණ ක්‍රමවේදය අතිශය දෘඪ කාර්යයක් වන බව ය.